**මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන පුද්ගලික සමාගම - 2019**

**----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**1.1 තත්ත්වාගණනය කළ මතය.**

මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්ගලික) සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ.

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය.

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිත ව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වා ගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම් වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවල දී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වා ගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූල නොවීම්.

| අනුකූල නොවූ ප්‍රමිත සඳහා යොමුව | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 27 වැනි වගන්තියට සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුවට පටහැනිව, සමාගම ස්ථාවර තැන්පතු මත පොලී ආදායම මුදල් පදනම මත හඳුනාගෙන තිබුණි. විගණනය මගින් ගණනය කරන ලද ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 8,864,145 ක් වූ නමුත් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු. 22,305,946 ක් ලෙස සඳහන් විය. එබැවින් මෙම ශේෂ දෙක අතර රු. 13,441,801 වෙනසක් නිරීක්ෂණය විය. | උපචිත පදනම මත පොලී ආදායම හඳුනා ගැනීම ඉතා අපහසු වනු ඇත. | ප්‍රමිතියට අනුව උපචිත පදනම මත වාර්ෂික පොලිය ඇතුළත් කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු.

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් වාර්ෂික මහා සභා රැස්වීම්වල අනුමැතියකින් තොරව 2008 සිට 2015 දක්වා කාලය සඳහා වෙන් කරන ලද ලාභාංශ වගකීම රු. 29,765,787 ක් වී තිබුණි. 2019 දෙසැම්බර් 31 වන විටත් මෙම මුදල පියවීමකින් තොරව ජංගම වගකීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මෙම වෙන්කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත සිදු කර ඇත. | ලාභාංශ ප්‍රතිපාදනය කළ හැක්කේ මහා සභා රැස්වීමක යෝජනා සම්මතයකින් පසුව පමණි. |

### 1.5.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් භාවිතා කරනු ලැබූ සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් පිරිවැය රු. 28,809,423 ක් විය. කෙසේ නමුත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 -දේපළ පිරියත හා උපකරණ ගිණුම් ප්‍රමිතය අනුව එම වත්කම් ප්‍රත්‍යාගණන කිරීමට හෝ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස් වීම් සහ වැරදි ප්‍රමිතය අනුව නැවත දැක්වීමට අදාළ ක්‍රියාමාර්ග සමාගම විසින් ගෙන නොතිබුණි. | එකඟ වේ. | සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ගිණුම්කරණය සම්බන්ධයෙන් ප්‍රමිති විධිවිධානයන් පිළිපැදිය යුතුය. |

### 1.5.5 ගිණුම්කරණ අඩුපාඩු.

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 5(1) වගන්තියට අනුව, වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ සෑම සේවකයෙකු සඳහා සම්පූර්ණ කරන ලද සෑම වසරක් සඳහාම අවසන් වරට ලබාගත් මාස භාගයක වැටුපට සමාන පාරිතෝෂික මුදලක් ගෙවිය යුතුය. කෙසේ වෙතත් සමාගම පාරිතෝෂික ගණනය සඳහා තම ප්‍රතිපත්තිය ලෙස මාසයක වැටුපක් සලකා බලා තිබූ නමුත් එම ප්‍රතිපත්තිය කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කර නොතිබුණි. එබැවින් ගෙවිය යුතු පාරිතෝෂික මුදල ඉක්මවා රුපියල් 1,686,925ක් වැඩිපුර ගෙවා තිබුණි. | සමාගමේ ප්‍රතිපත්තිය ලෙස මාසයක මූලික වැටුප ප්‍රතිපාදන සඳහා යොදා ගනී. | සමාගම පවතින නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට වසර හයකට වැඩි කාලයක සිට සමාගමකට ගෙවිය යුතු රු. 24,500,000 ක ශේෂයක් පියවා නොතිබූ අතර මේ සම්බන්ධයෙන් විගණනය සඳහා කිසිදු තොරතුරක් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම නඩුවේ තීන්දුව ලැබෙන තුරු එම ගෙවීම නතර කිරීමට සමාගම් කළමනාකාරීත්වය තීරණය කර ඇත | ශේෂය තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලුම සාක්ෂි සමාගම විසින් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු මුදල රු. 5,861,611 ක් විය. කෙසේ වෙතත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු. 8,290,154 ක් ලෙස දැක්වුණි. එබැවින් එම ශේෂ දෙක අතර රු. 2,428,542 ක වෙනසක් දක්නට ලැබුණු අතර මේ සම්බන්ධයෙන් සැසඳීමක් ද සිදු කර නොතිබුණි. තවද සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අධිකාරියට ගෙවිය යුතු මුදල රු. 1,471,358 ක් වූවද, 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, කුලී ගාස්තු සඳහා සමාගමෙන් අයවිය යුතු මුදල රු. 471,358 කි. එබැවින් ශේෂ දෙක අතර රු.1,000,000 ක වෙනසක් දක්නට ලැබුණු අතර මේ සම්බන්ධයෙන් සැසඳීමක් සිදු කර නොතිබුණි. | රු. 5,861,611 ක් වන මූල්‍ය ප්‍රකාශන ශේෂය නිවැරදි ශේෂය වන අතර එම මුදල 2020 මුදල් වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවා ඇත. ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 1,471,358 ක් වූ අතර එය නිවැරදි ශේෂයයි. රු. 1,000,000 මේ දක්වා සමාගමේ ගිණුම්වල නොගෙවූ ණයක් ලෙස සටහන් වේ. දන්වා ඇති පරිදි කොටස් දායකත්වයක් ලෙස එම මුදල RDA විසින් මෙම සමාගමට ලබා දී ඇති බව සඳහන් කල ද නිසි ලියකියවිලි RDA වෙතින් ලැබී නොමැති අතර ඉන් පසුව කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී මෙම විෂය පිළිබඳව සාකච්ඡා කර නොමැත. එබැවින් එම මුදල 2004 වසරේ සිට නොගෙවූ ණයක් ලෙස සටහන් කර ඇත. | සැසඳීමේ ලේඛන කාලානුරූපීව සකස් කළ යුතු අතර වෙනස් කම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 30,865,549 ක අලාභයක් වූ අතර ඊට අනුරූප පෙර වසරේ අලාභය රු. 75,767,179 ක් විය. එම නිසා රු. 44,901,633 ක මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ප්‍රතිඵලය එසේ වර්ධනය වීමට සමාගමේ සේවක මණ්ඩල වියදම්, පරිපාලන වියදම් සහ මූල්‍ය පිරිවැය පිළිවෙලින් සියයට 49, සියයට 38 සහ සියයට 59 යන ප්‍රතිශතවලින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ ප්‍රධාන ගැනුම්කරු වන මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සමාගමට ඇණවුම් ලබා නොදීම හේතුවෙන් වසරේ ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 89 කින් අඩු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන් වල ප්‍රවණතා විශ්ලේෂණය.

| අයිතමය | 2018 | 2019 | වෙනස | වෙනස් වීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| ඉමල්ෂන් විකිණීමෙන් ලද ආදායම | 82,632,917 | 8,739,704 | (73,893,213) | (89) |
| විකුණුම් පිරිවැය | 78,596,910 | 12,247,620 | (66,349,290) | (84) |
| වෙනත් ආදායම් | 15,332,290 | 22,416,541 | 7,084,251 | 46 |
| සේවක මණ්ඩල වියදම් | 63,083,966 | 32,125,005 | (30,958,961) | (49) |
| පරිපාලන වියදම් | 7,450,694 | 4,641,467 | (190,773) | (2) |
| බෙදාහැරීමේ හා විකුණුම් පිරිවැය | 4,578,807 | 307,258 | ( 4,271,549) | (93) |
| මූල්‍ය පිරිවැය | 10,819,741 | 4,463,998 | ( 6,355,743) | (59) |

මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) සමාගම විසින් ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමයක් (VRS) ක්‍රියාත්මක කර තිබූ බැවින් කාර්ය මණ්ඩල වියදම් අඩු වී තිබුණි. කෙසේ වෙතත්, පෙර වසරට වඩා පොලී අනුපාත සැලකිය යුතු ලෙස වැඩි වීම නිසා අනෙකුත් ආදායම් යටතේ වූ පොලී ආදායම සියයට 46 කින් ඉහළ ගොස් තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය.

| | 2019 | 2018 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1.83 | 1.63 |
| ක්ෂණික අනුපාතය | 1.19 | 1.29 |
| දල ලාභ අනුපාත- ප්‍රතිශතය | (40) | 4.9 |
| ශුද්ධ ලාභ අනුපාත- ප්‍රතිශතය | (353) | (91.7) |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ ජංගම වත්කම් අනුපාතය පිළිගත හැකි මට්ටමට වඩා තරමක අඩු මට්ටමක් පැවති අතර ක්ෂණික වත්කම් අනුපාතය වාර්තා කරන දිනට පිළිගත හැකි සීමාවන් තුළ පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සමාගමේ ආදායම පෙර වසරට සාපේක්ෂව පහත වැටීම නිසා දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය විශාල අගයකින් පිරිහී තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකරණ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරියේ සහ රේඛීය අමාත්‍යාංශයේ එකඟතාවය මත මූල්‍ය හා පරිපාලන රාමුව සකස් කර නොතිබුණි. | පිළියල කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය හා පරිපාලන රාමුව සකස් කළ යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු.**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකරණ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්තා අනුව අධිකාරිය විසින් 2004 වර්ෂයේ දී සමාගම වෙත රු. 1,000,000 ක් ප්‍රාග්ධන දායකත්වය ලෙස ලබා දී තිබුණි. නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විට සමාගම විසින් ඒ සඳහා කොටස් නිකුත් කර නොතිබූ අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල දිගු කාලීන වගකීම් ලෙස දක්වා තිබුණි. කෙසේ නමුත් මාර්ග සංවර්ධන අධිකාරිය මෙය සමාගමේ හිමිකම සඳහා දායකවීම් ලෙස වාර්තා කර තිබුණි. | ඉහත කී රු. 1,000,000 මේ දක්වා සමාගමේ ගිණුම්වල නොගෙවූ ණයක් ලෙස සටහන් වේ. | අධිකාරිය සහ සමාගම මෙම ගැටලුව නිරවුල් කර ගත යුතුයි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකරණ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාගම විසින් සුදුසු සේවක සංඛ්‍යාවක් සහ බඳවා ගැනීම් සහ උසස්වීම් පටිපාටියක් ඇතුළත් කරමින් මානව සම්පත් සැලැස්මක් අනුමත කර ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත මානව සම්පත් අත්පොතක් (Manual) තිබේ. | සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමේ සහ උසස්වීම් ක්‍රමය සඳහා අනුමැතිය, අදාළ සියලුම බලධාරීන්ගෙන් ලබාගත යුතුය. |

**04. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය.**

**4.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකරණ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම නියමිත දින සිට වසර දෙකකින් පමණ ප්‍රමාද වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශන එළඹෙන වසරේ පෙරවාරි 28 දින හෝ ඊට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 4.2 විගණන කමිටුව.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සමාගම විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | ඉදිරියේ දී පිහිටු වීමට පියවර ගනු ලැබේ. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටු වීමට කටයුතු කල යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් වාර්ෂික අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි. | ඉදිරි වසර සඳහා වාර්ෂික වාර්තාවක් සකස් කර තිබේ. | වාර්ෂික අයවැය ලේඛනයක් සකස් කළ යුතුය. |